**තල් සංවර්ධන මණ්ඩලය - 2016**

**------------------------------------**

තල් සංවර්ධන මණ්ඩලයේ ("මණ්ඩලය") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 44 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින්, 2016 දෙසැම්බර් 31 දිනට තල් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති රු.575,166 ක් වටිනාකම වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| කුලී ගෙවීම් | 372,238 | කුලී පදනම මත ලබාගත් කට්පහම් විකුණුම් මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල සඳහා තක්සේරු වාර්තා |
| ඉන්ධන වියදම් | 202,928 | වාහන භාවිතා කළ නිලධාරීන්ගේ අත්සන් හා ගමනේ අරමුණ |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවති තුන්වන පාර්ශවයන් පස් දෙනෙකු සඳහා ලබා දෙන ලද රු.1,444,866 ක අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවක සුභසාධක සංගමයට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හා P.P.S.C.S වන්නි යනාදිය සඳහා ගෙවිය යුතු ගිණුම් හා හස්ත කර්මාන්ත පුහුණු සඳහා ප්‍රතිපාදන එකතුව රු.5,068,804 ක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් හෝ මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව හිඟ ශේෂයන්හි ඇතුළත් කර තිබුණි.

### 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) 1971 අංක 38 දරන මුදල් පනත** | |
| 14(3) වගන්තිය | 2012, 2013, 2014 හා 2015 වර්ෂ සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| i මුදල් රෙගුලාසි 272 (3) | සියලු ගෙවීම් වවුචර් ඒවා අදාළ වන මාසය අවසානයේ සිට සති 6 ක් ගත වීමට පෙර මාසිකව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| ii මුදල් රෙගුලාසි 445 | දිස්ත්‍රික් කාර්යාල හා විකුණුම් මධ්‍යස්ථාන විසින් ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| iii මුදල් රෙගුලාසි 715 | මණ්ඩලයට අයත් විකුණුම් මධ්‍යස්ථාන විසින් විධිමත් ගබඩා පරිපාටි අනුගමනය කර නොතිබුණි. |
| iv මුදල් රෙගුලාසි 751 (1) | - මිලදී ගැනුම් සටහන් කිරීමේදී හා තොග පොත්වල ඉන්වෙන්ට්‍රි පවත්වා ගැනීමට අදාළව විවිධ අඩුපාඩු නිරීක්ෂණය විය.<br>- ලැබීම්, නිකුත් කිරීම් හා ඉදිරියට ගෙන යන ලද ශේෂ පැහැදිලිව දැක්වෙන පරිදි අප්‍රමාදීව ඉන්වෙන්ට්‍රි ලේඛනය පවත්වා නොතිබුණි. |
| v මුදල් රෙගුලාසි 1010 (ආ) | සමීක්ෂණ මණ්ඩලය විසින් මෝටර් වාහන භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. |
| **(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| 4.2.5 ඡේදය | මණ්ඩලය විසින් එහි කාරක ප්‍රාග්ධනය පිළිබඳ ඵලදායී කළමනාකරණය සඳහා පද්ධති සකස් කර නොතිබුණි. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පහත සඳහන් ප්‍රකාශන මාසික පදනමින් සමාලෝචනය කර නොතිබුණි.<br>- ණයගැතියන් හා ණයහිමියන් පිළිබඳ කාල විශ්ලේෂණය<br>- තොග පිළිබඳ කාල විශ්ලේෂණය<br>- පැරණි, සෙමින් චලනය වන හා යල්පැන ගිය තොග හා වෙනත් විෂයයන් හඳුනාගැනීමේ ප්‍රකාශන |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.128,597,258 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.125,783,577 ක් වූයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,813,681 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. රු.130,574,756 ක් වූ පර්යේෂණ හා සංවර්ධන වියදම හා පුහුණු වියදම සමාලෝචිත වර්ෂය සඳහා ආදායමට එරෙහිව අය කිරීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 128.59 ක ඌනතාවයක් වුවද, පුද්ගලික පඩිනඩි, රජයට ගෙවන ලද වරිපනම් හා බදු සහ ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයෙන් රටට වන දායකය රු.මිලියන 215.15 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයට අගය එකතු කිරීම රු.මිලියන 86.56 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට අගය එකතු කිරීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 15 කින් වැඩි වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මුළු මෙහෙයුම් වියදම රු.165,738,779 ක් වූ අතර ඉන් රු.120,080,365 ක් හෙවත් සියයට 72 ක් පුද්ගලික පඩිනඩි සඳහා දරන ලද වියදමින් නියෝජනය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

මණ්ඩලය විසින් එහි ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හා රටේ ජාතික ආර්ථික සංවර්ධනයට දායක වීම සඳහා එහි නිෂ්පාදන මට්ටම් වැඩිකර ගැනීමට හා විවිධ වර්ගයේ තල් නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීමට සමාලෝචිත වර්ෂයේදී ද කඩිනම් හා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 4.2 මෙහෙයුම් දුර්වලතා

#### 4.2.1 තික්කම් ස්කාගාර ව්‍යාපෘතිය මෙහෙයවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වදමරච්චි තල් සංවර්ධන සමුපකාර සමිති පොකුරු ව්‍යාපෘතිය සමඟ 2008 අප්‍රේල් 10 දින එළඹි බදු ගිවිසුම අනුව, මණ්ඩලය සතු වටිනා වත්කම් බදු පදනම මත එම සමිතියට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2008 මැයි සිට බදු ගිවිසුමේ 01 හා 02 ඡේද ප්‍රකාරව මාසික රාජ්‍ය භාගය හා බදු කුලිය අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ii) 2016 පෙබරවාරි 25 දින සිදුකරන ලද භෞතික සත්‍යාපනයේදී, සමිතියට ලබා දී තිබූ ඇතැම් වත්කම්, අරමුණු කළ කාර්යයන් සඳහා භාවිතා කිරීමෙන් තොරව පැවති බවත් සමහර වත්කම් හානි වී තිබූ බවත් අනාවරණය විය.

(ආ) තික්කම් ස්කාගාරය නවීකරණය සඳහා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද රු.මිලියන 112.5 ක ප්‍රතිපාදනය මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි.

### 4.2.2 පාඩු පිට පවත්වා ගෙන යන ආදර්ශ ගොවිපොළවල්

ආදර්ශ ගොවිපොළවල් 6 ක් පසුගිය වර්ෂ 03 ක් සඳහා අඛණ්ඩව පාඩු ලබමින් පවත්වා ගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ හා පසුගිය වර්ෂ 02 ක කාලපරිච්ඡේදය තුළ දරන ලද පාඩු පහත දැක්වේ.

| ආදර්ශ ගොවිපොළේ නම | වර්ෂ සඳහා පාඩුව | | |
|---|---|---|---|
| | 2016 | 2015 | 2014 |
| | රු. | රු. | රු. |
| කුඩදනායි | 276,556 | 688,821 | 545,045 |
| මන්මුනෙයි | 452,418 | 608,282 | 694,221 |
| ඩෙල්ෆ්ට් | 56,828 | 60,000 | 61,620 |
| පුලියන්කුලම | 2,283,204 | 2,383,310 | 1,771,618 |
| උර්වුපුලම් | 98,203 | - | 98,203 |
| වීරවිල | 3,078,144 | 2,302,275 | 1,415,480 |
| මුළු පාඩුව | 6,245,353 | 6,042,688 | 4,586,187 |

තවද පහත සඳහන් අක්කර 137 ක මුළු ප්‍රමාණයකින් යුතු ඉඩම් 2010 වර්ෂයේ සිට සම්පූර්ණයෙන් නිෂ්කාර්යව තිබෙන්ට ඉඩ හැර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගොවිපොළ පිහිටි ස්ථානය | ඉඩමේ ප්‍රමාණය ( අක්කර) |
|---|---|
| මන්මුනෙයි | 78 |
| අරිවියල් නගර් | 07 |
| ඕවුපුලම් | 50 |
| මුලන්කවිල් | 02 |
| එකතුව | 137 |

මෙම ඉඩම් තල් වගා ගොවිපළවල් ලෙස සංවර්ධනය කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති බව මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

### 4.2.3 බීජ හා වගාකරන ලද බීජාංකුර පිළිබඳ කාර්යසාධනය

-----------------------------------------------------------------

ඵලදායී වගාවක් සඳහා උපායමාර්ගයක් ලෙස නොමැරී පැවැත්මේ අනුපාතය වැඩිකරගැනීම සඳහා 2012 වර්ෂයේදී බීජාංකුර වගාව හඳුන්වා දෙන ලදී. මුල් අදියරේදී බීජාංකුර වගාව සියයට 70 සිට සියයට 75 දක්වා නොමැරී පැවැත්මේ ඉහළ අනුපාතයක් දක්වා තිබුණද, සතුන් හා ඌරන් විසින් (අල සඳහා) පහසුවෙන් ඉවත් කර ගත හැකි ඇතැම් විවෘත වගා බිම් ස්ථානවල එය දීර්ඝ කාලයක් නොපැවතුණි. මෙම තත්ත්වය, විවෘත වගා බිම් ස්ථානවල පවත්වා ගැනීමේ අනුපාතය සියයට 10 කටත් අඩු ප්‍රමාණයකට හේතු වී තිබූ අතර වැසුණු ප්‍රදේශවල (යහපත් ආරක්ෂාවක් සහිත වැටවලින් කොටුකරගත් ඉඩම්) පැළ කරන ලද බීජාංකුර පසු අදියරේදීද සියයට 70 ක පවත්වා ගැනීමේ අනුපාතයක් දක්වා තිබුණි.

එබැවින් පොදු ව්‍යාපාර කාරක සභාව (COPE) විසින් 2016 මාර්තු 11 දින බීජාංකුර නිෂ්පාදනය අත්හිටුවීම සඳහා නියෝග ලබා දී තිබුණි. කෙසේ වුවද, පොදු ව්‍යාපාර කාරක සභාව විසින් ලබා දී තිබූ නියෝගවලට පටහැනිව වැටවල් සහිත ඉඩම්වලට පමණක් බීජාංකුර නිකුත් කර තිබූ අතර, ආර්ථිකව ඵලදායී වගාවක් පවත්වා ගැනීමේ අරමුණින් විවෘත ප්‍රදේශවල (මාර්ග දෙපස, පිට්ටනි) වගාව සඳහා බීජ නිකුත් කර තිබුණි.

2014 වර්ෂයේ සිට 2016 දක්වා වර්ෂයන් තුළ වගාකරන ලද බීජ හා බීජාංකුර පිළිබඳ කාර්යසාධනය පහත පරිදි වේ.

| | වගාකරන ලද බීජ සංඛ්‍යාව | වගාකරන ලද බීජාංකුර සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| 2014 | 382,700 | 25,610 | 408,310 |
| 2015 | 1,183,755 | 4,000 | 1,187,755 |
| 2016 | 170,000 | 4,300 | 174,300 |

### 4.2.4 තල් පර්යේෂණ ආයතනය පිළිබඳ මෙහෙයුම්

----------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 සිට 2016 කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ කාර්යයන් සිදු කිරීම සඳහා රු.මිලියන 65 ක මුදලක් වැයකර තිබුණද, එම පර්යේෂණ කාර්යයන් වලින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හෝ තල් වගා ප්‍රජාව ප්‍රතිලාභ ලබා නොතිබුණි.

(ii) පවත්නා වෙළඳපොළ අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා විධිමත් පර්යේෂණයන් සිදුකිරීමෙන් පසු තල් පදනම් කරගත් නව නිෂ්පාදන හඳුන්වා දීමට ආයතනයට නොහැකි වී තිබුණි.

### 4.2.5 කටුපහම් විකුණුම් මධ්‍යස්ථාන මෙහෙයුම්

----------------------------------------

උපාය මාර්ගික වෙළඳපොළ සැලසුම් හා විධිමත් නියාමන පද්ධති නොමැතිව කටුපහම් විකුණුම් මධ්‍යස්ථාන මෙහෙයවීම හේතුවෙන් කටුපහම් විකුණුම් මධ්‍යස්ථාන 16 ක් සමාලෝචිත වර්ෂය තුළ රු.9,978,883 ක පාඩුවක් සහිතව ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

## 4.2.6 ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන්

තල් පර්යේෂණ ආයතනයේ සිදු කෙරෙන නව නිෂ්පාදන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වැඩ 2017 පෙබරවාරි 28 දිනට හෝ ඊට පෙර නිම කළ යුතු විය. කෙසේ වුවද, 2017 ජුනි 10 දක්වා සියයට 70 ක වැඩ පමණක් නිම කර තිබුණි.

## 4.2.7 තල් සම්බන්ධ ජීවනෝපාය කාර්යයන්

සමාලෝචිත වර්ෂය තුළ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, යළි පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් තල් සම්බන්ධ ජීවනෝපාය කාර්යයන් සඳහා රු.මිලියන 160 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. ඉන් රු.මිලියන 80 ක මුදලක් පමණක් යාපනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් උපයෝජනය කර තිබූ අතර ඉතිරි ප්‍රතිපාදන 2017 අගෝස්තු 31 දක්වා අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 4.3 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීරවිල ආදර්ශ ගොවිපොළේ නිෂ්පාදනය කරන ලද අත්කම් භාණ්ඩ විෂයයන් සඳහා තිස්සමහාරාම ප්‍රදේශයේ විශාල ඉල්ලුමක් පවතින නමුත් වීරවිල ආදර්ශ ගොවිපොළේ නිෂ්පාදන ධාරිතාව ඉහළ දැමීමට පියවරක් ගෙන නොතිබුණි. තවද ඉහළ ප්‍රවාහන පිරිවැයකට හේතු වන කොළඹ සහ මඩකලපුවෙන් එම විෂයයන් මෙම ගොවිපොළ විසින් මිලදී ගෙන තිබුණි.

(ආ) බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටියේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් නොමැතිව කළමනාකරු (අලෙවි හා නිෂ්පාදන) සහ වෙනත් සේවකයින් 51 ක් පත් කර ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් 2016 මාර්තු 11 දින පොදු ව්‍යාපාර කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝගය පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(ඇ) නිෂ්පාදන පිරිවැය ඉහළයාම හා නිෂ්පාදන මධ්‍යස්ථානවල දුර්වල කාර්යසාධනය හේතුවෙන් යාපනය හා මන්නාරම මධ්‍යස්ථානවල තල් කෙඳි නිෂ්පාදනය අඩුවීමේ ප්‍රවණතාවයක් වාර්තා කර තිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණක විසින් රාජකාරී සඳහා වාර්තා නොකළ කාල පරිච්ඡේදයේ දින 320 ක් සඳහා වැටුප් ලෙස රු.505,231 ක මුදලක් ඔහු වෙත ගෙවා තිබුණි. කොළඹ කම්කරු උසාවිය විසින් ලබාදෙන ලද නඩු තීන්දුව මත පදනම්ව අදාළ අභ්‍යන්තර විගණකවරයා කළමනාකරණය විසින් නැවත සේවයේ පිහිටුවන ලද බව මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් දන්වා තිබුණි. සියලු පූර්ව වේතන හා වෙනත් රජයේ අනුමත දීමනා සමඟ නැවත සේවයේ පිහිටුවීමට නඩු තීන්දුවෙන් දක්වා තිබුණි.

## 4.4 මානව සම්පත් කළමනාකරණය

පුරප්පාඩු ස්ථිරව පිරවීමට කටයුතු කිරීමෙන් තොරව පුද්ගලයන් 06 දෙනෙකුගෙන් අනියම් පදනම මත අඛණ්ඩව සේවය ලබාගෙන තිබුණු අතර, ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 12 දෙනෙකු සඳහා අනුමැතිය ලබාගැනීමට හා සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පුරප්පාඩු 17 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 4.5 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් වාහන 4 ක් මගින් කරන ලද කිලෝමීටර් 976 කට අදාළ ගමන් සඳහා අරමුණ ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.

(ආ) කිලෝමීටර් 1,004 ගමන් සඳහා යොදා ගන්නා ලද මෝටර් වාහන 9 ක දෛනික ධාවන සටහන්වල වාහන පාවිච්චි කරන ලද නිලධාරින්ගේ අත්සන් තබා නොතිබුණි.

(ඇ) 1990 ඔක්තෝබර් 19 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, මෝටර් වාහන 27 ක ඉන්ධන දහනය පරීක්ෂා කිරීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි.

## 4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් තල් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලද අරමුදල්වලින් ලැප්ටොප් පරිගණක 20 ක් මිලදී ගැනීම සඳහා රු.2,525,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම පරිගණක බෙදා හැර නොතිබූ අතර මණ්ඩලයේ ගබඩාවේ නිෂ්කාර්යව තිබෙන්ට ඉඩ හැර තිබුණි.

## 4.7 පෙර වර්ෂ විගණන වාර්තා වලින් පෙන්වා දෙන ලද නොවිසඳී ඇති විගණන ඡේද

(අ) කොළඹ - 04 පිහිටි ගොඩනැගිල්ලේ කොටසක් උප බදු දීම වෙනුවෙන් ගොඩනැගිල්ලේ එම උප බදු දී ඇති කොටසට අදාළ බිල්පත්‍ර වෙනම ගෙවූ බවට තහවුරු කිරීම සඳහා අදාළ ලියකියවිලි විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස ගිණුම් නිලධාරියාට නියෝග කර තිබුණද විදුලිය හා ජලය සඳහා මණ්ඩලය විසින් දරන ලද වියදම් වලට අදාළව 2016 මාර්තු 11 දින පොදු ව්‍යාපාර කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝගය පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) කරෙයිනගර් කර්මාන්ත සංකීර්ණයේ හා ඩෙල්ෆ්ට් හි ෆයිෆර් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වැඩ පිළිවෙලින් රු.7,377,318 ක් හා රු.900,000 ක් වැය කර 2015 වර්ෂයේදී නිමකර තිබුණද කර්මාන්ත කටයුතු පිළිබඳ මෙහෙයුම් ආරම්භ කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.2,443,879 ක මුදලක් අභ්‍යන්තර විගණනය සඳහා වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන ඒකකය ඵලදායී ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන ඒකකයේ ඵලදායී නොවන කාර්යයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් බොහෝ දුර්වලතා නිරීක්ෂණය විය.

(ඇ) කාර්තුමය විගණන වාර්තා හා විගණන විමසුම්වල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) තල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ සඳහා සෑම වර්ෂයකම රුපියල් මිලියන ගණනින් වැය කර තිබුණද, එම ආයතනයේ ඉදිකිරීම් වැඩ හා කාර්යයන් අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර සියයට 10 සිට සියයට 112 දක්වා පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත්කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. තල් පර්යේෂණ ආයතනයේ ස්ථාවර වත්කම් පිළිබඳ පාලනය හා පර්යේෂණ කාර්යයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.